# ශ්‍රී ලංකාවේ පෘතුගීසී අවධියට අයත් පැරණිතම ස්මාරක පිළිබඳ අධ්‍යයනයක්

**ඒ.ඩබ්ලිව්.ඒ.එච්.සී. ගුණසිංහ**

පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය,

කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

hachagu@gmail.com

ප්‍රමුඛ පද : පෘතුගීසී යුගය, පෘතුගීසී ස්මාරක, දේශ ගවේෂණ, කෝට්ටේ රාජධානිය

**හැඳින්වීම**

වර්ෂ 1543දී පෙර'පර දෙදිග එක් කළ යුරෝපයේ වෙළෙඳ මධ්‍යස්ථානය වූ කොන්ස්තන්තිනෝපල් නගරය අල්ලාගත් ඔටෝමාන් තුර්කිවරුන් විසින් අධික මිළක් යටතේ පෙරදිග භාණ්ඩ අලෙවි කිරීම, යුරෝපීයයන් පෙරදිග ගවේෂණය සඳහා යොමු කර ලීමට බලපෑ ප්‍රධාන හේතුව වශයෙන් හඳුනාගත හැකි ය. ඒ යටතේ පෙරදිග වෙළෙඳාම අත්පත් කොටගෙන, අධික ලාභ උපයා ගැනීමේ බලාපොරොත්තුව පෙරදැරි ව යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණිය හැකි මුහුදු මාර්ග සෙවීමට යුහුසුළු වූ අතර තරගයක් බවට එයින් ජය හිමිවූයේ පෘතුගාලයට ය. පෙරදිග ප්‍රදේශවල වෙළෙඳ බලය ව්‍යාප්ත කිරීමේ දී ඒ වන විට එහි වෙළෙඳ බලය අත්කරගෙන සිටි මුස්ලිම්වරුන්ගේ පෘතුගීසීන්ට එල්ල වූයේ ප්‍රබල විරෝධයකි. එහි ප්‍රතිඵලය වූයේ මුස්ලිම් වෙළෙඳ නැව් මංකොල්ල කමින්, මුස්ලිම් වෙළෙඳුන් මරාදමමින් දැඩි මර්ධනකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට පෘතුගීසීන් පෙළඹීමයි.

මුස්ලිම් වෙළෙඳ නැව් කීපයක් හඹා ගිය පෘතුගීසී නාවික කණ්ඩායමක් කුණාටුවකට හසු ව අහඹු ලෙස ලංකාවට ගොඩබැසීම ලංකා ඉතිහාසයේ සන්ධිස්ථානයකි. කෝට්ටේ රාජධානියේ රජු සමග වෙළෙඳ ගිවිසුමකට එළැඹි ඔවුන් විසින් කොළඹ වරාය ආසන්නයේ දේවස්ථානයක් හා ගබඩාවක් ඉදිකරන ලද්දේ රජුගේ අවසරය ඇතිව ය. ඒ සමගම කොළඹ වරාය ආසන්නයේ ගල් කුළක පෘතුගීසි රාජකීය ලාංඡනය කෙටවීමට ද ඔවුන් විසින් කටයුතු කරන ලද අතර එය ලංකාවේ පැරණිතම පෘතුගීසි ස්මාරකය වශයෙන් හඳුනාගත හැකි ය.

කොළඹ වරායේ පෘතුගීසීන් විසින් පිහිටුවන ලද පෘතුගීසී රාජකීය ලාංඡනය සහිත මෙම ස්මාරකය පිළිබඳ අධ්‍යයනය කිරීම අරමුණ කරගත් මෙම පර්යේෂණයේ දී, පර්යේෂණ ගැටලුව බවට පත් වූයේ


මෙවැනි ස්මාරකයක් පිහිටුවන්නට කිනම් අන්දමේ හේතු සාධක බලපාන්නට ඇත් ද යන්න සොයාබැලීමයි.

## ක්‍රමවේදය

පෘතුගීසීන් විසින් කොළඹ වරායේ පිහිටුවන ලද පෘතුගීසී රාජකීය ලාංඡනය සහිත ස්මාරකය පිළිබඳ අධ්‍යයනය කළ මෙම පර්යේෂණයේ දී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් භාවිත කරන ලද්දේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීමයි. ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය හා ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රය යොදාගැනුණු අතර අන්තර්ජාල මූලාශ්‍රය ඇසුරෙන් ද මෙම පර්යේෂණය සඳහා තොරතුරු එක්රැස් කරගන්නා ලදී. එම තොරතුරු සන්සන්දනාත්මක ව අධ්‍යයනය කිරීම මගින් අවසන් ප්‍රතිඵලයට එළඹීමට හැකිවිණි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

වර්ෂ 1505 දී මෙරටට පැමිණි පෘතුගීසීන් විසින් කෝට්ටේ රජුගේ අවසරය ඇති ව කොළඹ වරාය ආසන්නයේ ගල් පර්වතයක පෘතුගීසී රාජකීය ලාංඡනය සටහන් කරවීමට කටයුතු කරන ලදී. එහි පෘතුගාල රාජකීය ලාංඡනය සහ ඊට ඉහළින් කුරුසයක් ද, පෘතුගාල රාජකීය ලාංඡනයට දකුණු පසින් පහළට වන්නට JSOI අක්ෂර හතර හා ඊට පහළින් එකට බැඳී පවතින G G අක්ෂර දෙකක් දකගත හැකි ය. JSOI යන අක්ෂර සතරින් පෘතුගීසීන් විසින් පෙරදිග ප්‍රදේශවල කතෝලික දහම ව්‍යාප්ත කිරීමේ දී භාවිත කරන ලද *'Jesus Salvator Orientalium Indiorum'* එනම් 'නැගෙනහිර ඉන්දියාවේ ගැලවුම් කරුවාණෝ ජේසුස් වහන්සේය'යන අදහස ද, ඊට පහළට වන්නට ඇති G G අක්ෂර ද්විත්වයෙන් මෙම ලාංඡනය කෙටීම සිදුකළ ගොන්සාලේ ගොන්සාල්වේස් කැටයම් ශිල්පියාව ද නිරූපණය කර ඇතැයි නිගමනය කෙරේ. (රූප සටහන 1)



රූප සටහන 1 (https://en.wikipedia.org/wiki/3rd_Portuguese_India_Armada_(Nova,_1501)

ගල් පර්වතයක පෘතුගාල රාජකීය ලාංඡනය කෙටවීම කුමන පදනමක් යටතේ සිදු කළේ ද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී එය පෘතුගීසී දේශ ගවේෂණ ව්‍යාපාරය සමග බැඳී පවතින නිර්මාණයක් බව හඳුනාගත හැකි ය. පෘතුගීසී දේශ ගවේෂකයන් විසින් නව දේශයක් සොයාගනු ලැබූ විට එකී දේශය පිළිබඳ පෘතුගාලයට ඇති අයිතිය පෙන්වීම පිණිස කිසියම්


ස්මාරකයක් ඉදිකරවීමේ සිරිතක් පැවති බවට සාධක හමු වේ.

පෘතුගාල දේශ ගවේෂණ ස්මාරක පිහිටුවීමේ අවධි තුනක් හඳුනාගත හැකිය. ඒවා පිළිවෙලින් මෙසේ ය.

- විශාල ප්‍රමාණයේ දැව කුරුසයක් ස්ථාපනය කිරීම
- ගල් පර්වතයක පෘතුගීසි රාජ්‍ය ලාංඡනය සහ දේශ ගවේෂණයේ තොරතුරු සඳහන් කිරීම
- දේශ ගවේෂණයේ තොරතුරු සඳහන් *Padrão* නම් ශිලා ස්ථම්භ පිහිටුවීම

දේශ ගවේෂණ ව්‍යාපාරය ආරම්භයේ දී පෘතුගීසී දේශාටකයන් විසින් තමන් ගවේෂණය කර සොයාගන්නා ලද නව ප්‍රදේශවල ශක්තිමත් ලීයකින් කළ විශාල ප්‍රමාණයේ කුරුසයක් ස්ථාපනය කර එම ප්‍රදේශය කතෝලිකයන්ට අයත් ප්‍රදේශයක් ලෙස නිරූපණය කළ බවට සාධක හමුව තිබේ.

ශක්තිමත් දැවයකින් නිර්මාණය කළ කුරුසයක වුව ද, කල්පැවැත්ම පිළිබඳ ගැටළු ඇති වූ හෙයින් ඒ වෙනුවට තමන් විසින් සොයාගන්නා ලද නව ප්‍රදේශයේ පිහිටි ගල් පර්වතයක පෘතුගාල රාජකීය ලාංඡනය, කුරුසය හා ගවේෂණය සිදුකළ පුද්ගලයාගේ නම ඇතුළත් විස්තර සඳහන් කිරීමට පෘතුගීසීන් විසින් කටයුතු කරන ලදී. මීට උදාහරණයක් ලෙස වර්ෂ 1485දී අප්‍රිකාවේ යෙලාලා දිය ඇල්ල අසළපෘතුගීසී දේශ ගවේෂක Diogo Cao විසින් පිහිටුවන ලද පෘතුගීසී රාජකීය ලාංඡනය, කුරුසය හා චාරිකාවේ විස්තර ඇතුළත් ස්මාරකය දැක්විය හැකිය. (රූප සටහන 2)



රූප සටහන 2 (https://en.wikipedia.org/wiki/Yellala_Falls)

ගවේෂණය කරනු ලබන නව ප්‍රදේශ සෑම එකක ම පාහේ ගල් පර්වත නොතිබීමේ ගැටලුව මත පසුව ශෛලමය ස්ථම්භයක මුදුනත පෘතුගීසී රාජකීය ලාංඡනය ද, ඊට ඉහළින් කුරුසය හා ස්ථම්භයේ සිලින්ඩරාකාර කොටසේ දේශ ගවේෂණයේ විස්තර ද අන්තර්ගත දේශ ගවේෂණ ස්ථම්භ පිහිටුවීමට පෘතුගීසීන් විසින් කටයුතු කරන ලදී. *Padrão* යන නමින් හඳුන්වන ලද මෙම කුළුණු දේශ ගවේෂණ චාරිකා පිටත්වයාමේ දී ඔවුන් විසින් ගෙනයනු ලැබූ අතර Diogo Cao, Bartolomeu Dias සහ වස්කෝ ද ගාමා වැනි දේශ ගවේෂකයන් විසින් පිහිටවනු *Padrão* කුළුණු වර්තමානයේ දී ද දැකගත හැකි ය. (රූප සටහන 3)



රූප සටහන 3 (https://en.wiktionary.org/wiki/padrão)

ලංකාවේ පිහිටුවන ලද පෘතුගීසී දේශ ගවේෂණ ස්මාරකය මේ අතුරින් දෙවැනි ගණයට අයත් වුව ද, දේශ ගවේෂණය සඳහා මූලික වූ අයගේ නම් ආදිය ඉන් දැකගත නොහැකිවීම ගැටලු සහගතය. එකී තොරතුරු පැවති කොටස විනාශ වන්නට ඇතැයි හෝ යම් හෙයකින් එම තොරතුරු එහි සටහන් නොකරන්නට ඇතැයි ද යනුවෙන් අනුමාන කළ හැකි ය.

ලංකාවේ වෙරළබඩ පළාත්වල පැවති පෘතුගීසී බලය වර්ෂ 1640 වන විට බිඳවැටීමත් සමග පෘතුගීසී නිර්මාණ රාශියක් ලන්දේසීන් අතින් විනාශයට පත් වූ අතර මෙම පෘතුගීසී ස්මාරකය පිළිබඳව ද අවධානයක් යොමු වූ බවක් නොපෙනේ. සියවස් දෙකකට පමණ පසු වර්ෂ 1875 දී කොළඹ වරායේ නිරිතදිග දියකඩනය සම්බන්ධ ඉදිකිරීම් කටයුතු සිදුකරන ලද පොදු වැඩ දෙපාර්තමේන්තුවේ කම්කරුවන් පිරිසකට මෙම පෘතුගීසී ස්මාරකය හමුවීමත් සමග නැවත වරක් මේ පිළිබඳ අවධානය යොමුවිණි. මෙහි වටිනාකම වටහාගත් බ්‍රිතාන්‍ය පාලකයන් විසින් දියකඩනයේ ඉදිකිරීම්වලින් එයට හානි වීම වැළැක්වීම සඳහා වර්ෂ 1898 දී පෘතුගීසී රාජකීය ලාංඡනය සහිත ගල් කුට්ටිය එතැනින් කඩා ඉවත්කොට වරායේ රේගු ගොඩනැගිල්ල ඉදිරිපිට ද, පසුව එය වර්ෂ 1912 දී කොළඹ රැජිණ මන්දිරය අසළ ගෝර්ඩන් උද්‍යානයේ ද තැන්පත් කෙරිණි. මෑත කාලයේ දී නැවත වරක් එය කොළඹ වරාය පරිශ්‍රයේ තැන්පත් කිරීමට කටයුතු කර තිබේ.

බටහිර ජාතීන්ගේ නිර්මාණයක් වුවද, මෙම ස්මාරකය මෙරට ඉතිහාසය සමග බැඳී පවතින ලංකාවේ දැනට ඇති පැරණිතම පෘතුගීසී ස්මාරකයයි. එය පෘතුගීසී දේශ ගවේෂණ ව්‍යාපාරය හා සම්බන්ධ නිර්මාණයක් ද වන හෙයින් දෙස්විදෙස් පර්යේෂකයන්ගේ අවධානය මේ සඳහා යොමුවිය යුතු ව ඇත. කොළඹ නගරයේ ඇති යටත්විජිත නිර්මාණ පිළිබඳ සංචාරක අවධානය යොමු කරවීමේ වැඩසටහන් සැකසීමේ දී ද මෙම ස්මාරකය පිළිබඳ අවධානය යොමු කිරීම වටී.

**ආශ්‍රිත ග්‍රන්ථ**

පෙරේරා පියතුමා, එස්.ජී. (1963), *ලංකා ඉතිහාසය-පෘතුගීසි යුගය*, හේවාවසම්, පී.බී.ජේ. (අනු.), සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොළඹ.

බ්‍රෝහියර්, ආර්.එල්. (2011), *කොළොම් පුර පුරාවෘත්තය*, එදිරිසිංහ, පද්මා (පරි.), සී/ස විසිදුනු ප්‍රකාශකයෝ, නුගේගොඩ.

Pieris, P.E. (1992), *Ceylon: The Portuguese Era* Vol. 1, Tisara Prakasakayo Ltd., Dehiwala.